# කොළඹ විශ්වවිද්‍යාලය,ශ්‍රී ලංකාව
# නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය-සිව්වන වසර (මාර්ගගත)-2022

# මානව හිමිකම් නීතිය

(කාලය පැ තුනයි)

සම්පූර්ණ ප්‍රශ්න සංඛ්‍යාව: 06

ප්‍රශ්න **<u>තුනකට (03) පමණක්</u>** පිළිතුරු සපයන්න

(අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත්අකුරු වලට ලකුණු අඩු කරනු ලැබේ.)

---

1. සීලැන්ඩ් හී මහජනතාව අධිඋද්ධමය හේතුවෙන් දැඩි ආර්ථික අපහසුතාවන්ට මුහුණ පා සිටින අතර දිගුකාලීන දූෂණ ක්‍රියාපිළිවෙත් පිළිබඳව චෝදනා ලැබ සිටින ජනාධිපතිවරයාට සහ කැබිනට් මණ්ඩලයට ඉල්ලා අස්වන ලෙස බල කරමින් ඔවුහු වීදි බැස විරෝධතාවය පළකරමින් සිටිති. 2022 මැයි 21 වන දින අදාළ ප්‍රදේශයෙන් ඉවත්වන ලෙසට වූ පොලිස් අණ නොතකමින් විරෝධතාකරුවන් කණ්ඩායමක් සීලැන්ඩ් හී පාර්ලිමේන්තුව අවට රැස්විය. ඉන් අනතුරුව කිසිදු පූර්ව අනතුරු ඇඟවීමකින් තොරව පොලීසිය කඳුළු ගෑස් භාවිතා කළ අතර ඊට ප්‍රතිචාර දක්වමින් විරෝධතාකරුවන් මාර්ග බාධක වලට හානි කළ අතර, විවිධ දෑ පොලිසිය දෙසට විසිකර දමා ගසන ලදී.මෙකී කලබලකාරී ගැටුමෙන් අනතුරුවය අමල් කමල්, නිහාල් සහ ගැට්ටා ඇතුළු විරෝධතාකරුවන් ගණනාවක් අත්අඩංගුවට ගන්නා ලදී.විරෝධතාකරුවන් විසින් තමන් අත්අඩංගුවට ගැනීමේ හේතු විමසා සිටි අවස්ථාවේ දී “*අපි උඹලට ගැහුවම ඒක උඹලට දැනගන්න පුළුවන්*” ලෙස පොලිසිය පිළිතුරු දෙන ලදී. ඉන් අනතුරුව විරෝධතාකරුවන් ගේ ඇස් රෙදි වලින් බැඳ දමා, ඔවුන්ව නම් සඳහන් නොකළ ස්ථානයකට ගෙන යන අතර, එහිදී ඔවුන්ව අධිකරණය ඉදිරියට ඉදිරිපත් නොකර දින තුනක් රඳවාගෙන සිටින ලදී. ජනප්‍රිය පියානෝවාදකයකු වන අමල්ට ඇතැම් වැරදි සඳහා වරද පිළිගනිමින් ඔහු පාපොච්චාරණයක් ලියා නොදෙන්නේ නම්, ඔහුගේ දෑත් කපා දමන බවට පොලිසිය තර්ජනය කළේය. වෘත්තීයසමිති නායකයෙකු වන නිහාල් ට මෙකී දින 3 දී කිසිදු ආහාරයක් ලබා නොදුන් අතර, නීතිඥයෙකු වන කමල්ව කිසිදු වාතාශ්‍රයක් නොමැති දැඩි අඳුරු කුටියක රඳවා තබන ලදී. කමල් නීති උපදෙස් ලබාදීම පිණිස තම සහයන් මුණගැසීමට ඉල්ලා සිටි නමුත්, සම්පූර්ණ කාලය පුරාවට ඔහුව අඳුරු කුටියේ රඳවා සිටි අතර ඒ හේතුවෙන් ඔහුට හුස්ම ගැනීමේ අපහසුතා ඇති වූ බැවින් වෛද්‍ය ප්‍රතිකාර ලබා ලබාගැනීමට ද සිදුවිය. ගැට්ටා දූෂිත දේශපාලඥයන් ගෙන් පළි ගැනීම අවශ්‍ය බව ප්‍රකාශ කරමින් සමාජ මාධ්‍ය තුළ “*මේ සඳහා වගකිව යුත්තන් වන්දි ගෙවිය යුතුය*” ලෙස ලියා ඇති බව පැවසේ.ඇතැම් කැබිනට් අමාත්‍යවරු ඉලක්ක කර ගනිමින් ඇතැම් ස්ථානවල පුපුරණ ද්‍රව්‍ය තැන්පත් කර ඇති බවට ඔහුව සැක කරනු ලබයි. පොලිසිය ගැට්ටා ගේ බිරිඳ හා

දරුවන් විමර්ශන කාමරයට රැගෙන විත් ඔහුගේ දරුවන් දෙසට තුවක්කුව එල්ල කරගෙන "සත්‍ය පවසන" ලෙස ගැට්ටා ගෙන්.ඉල්ලා ඇත. තම බිරිඳගේ වැලපීම ඇසූ ගැට්ටා පුපුරණ ද්‍රව්‍ය සඟවා ඇති ස්ථාන වල නම් හෙළි කර තිබෙන අතර පසුව පොලිසිය එකී දෑ සොයාගෙන නිෂ්ක්‍රීය කර තිබේ.

සීලැන්ඩ් සහ ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය සහ ඔවුන්ගේ අන්තර්ජාතික මානව හිමිකම් වගකීම් සමාන බව උපකල්පනය කරමින් පොලීසිය ගෙන ඇති ක්‍රියාමාර්ගවල නෛතිකභාවය විවේචනාත්මකව අගයන්න.

(ලකුණු 100)

2. දේශපාලනීකරණය දෙබිඩි පිළිවෙත සහ වෘත්තීයමය නොවන ස්වභාවය පිළිබඳ වූ චෝදනා හේතුවෙන් මානව හිමිකම් කොමිසම ස්වකීය විශ්වාසනීයභාවය අහිමි කරගෙන ඇති බවටත්, එබැවින් දිගු කාලීන ප්‍රතිසංස්කරණ අවශ්‍ය බවටත් ප්‍රකාශ කිරීමට බොහෝ විචාරකයන්ව මෙහෙයවන ලදී.

(*Philip Alston, 'Reconceiving the UN Human Rights Regime: Challenges Confronting the New UN Human Rights Council' (2006) 7 Melb J Int'l L 185, 187-88.)*

ඉහත ගැටළු ආමන්ත්‍රණය කරමින් මානව හිමිකම් කොමිසම වෙනුවට හඳුන්වා දුන්, මානව හිමිකම් කවුන්සිලයේ සාර්ථකත්වය පිළිබඳව විවේචනාත්මකව අදහස් දක්වන්න.

(ලකුණු 100)

3. ඇලිමෝනියා යනු බෝලා මාලා ටෝලා සහ ක්‍රියා නම් කලාප 4 කින් සමන්විත රාජ්‍යයකි. ඇලිමෝනියා හි බහුතර ජනතාව බෝලාවරු වන අතර සීනු-බෝලා යනු බෝලා කලාපයෙන් කැඩී බිඳී ගිය කණ්ඩායමකි. බෝලා, රාජ්‍ය ආගම වන අතර එයට ප්‍රමුඛස්ථානය ලබා දීම ප්‍රකාශයට පත් කිරීමටත්, ඒ අනුව "*නීතියේ අදාළ ප්‍රතිපාදනයන්ට යටත්ව ආණ්ඩුක්‍රමව්‍යවස්ථාව තුළින් සියලුම අනෙකුත් ආගම්වලට ලබා දී ඇති අයිතිවාසිකම් තහවුරු කරන අතරේ, බෝලා ආගම ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පෝෂණය කිරීම රාජ්‍ය වගකීම විය යුතුය*" යන්න ප්‍රකාශයට පත් කිරීමටත් ඇලිමෝනියා හී ආණ්ඩුව, අණ්ඩුක්‍රමව්‍යවස්ථාවට සංශෝධනයක් යෝජනා කරනලදී. මාලාවරු සහ. සහ ටෝලාවරු මෙකී යෝජිත ආණ්ඩුක්‍රමව්‍යවස්ථා සංශෝධනයට සිය විරෝධය ප්‍ර කාශ කරන ලදී. සීනු-බෝලාන්වරු, මෙකී සංශෝධනයට එරෙහිව රටපුරා විරෝධතාවයන් පවත්වමින් කියා සිටියේ, ඔවුන් ආගමික සුළුතරයක් වන අතර බෝලාන්වරුන් තම ආගම ඇදහීම මර්දනය කරනු ඇති බවයි. ඇලිමෝනියා ආණ්ඩුවේ අධිකාරීන් විසින් සීනු- බෝලාන් විරෝධතාකරුවන්ව අත්අඩංගුවට ගෙන, අනිවාර්යය "නිර්රැඩිකල්කරණ" පිළිබඳ අධ්‍යාපනික සැසිවාර ඇතුළත් බෝලාන් පුනරුත්තාපන වැඩසටහන යටතේ බෝලාන් අධිකාරීන් තුළ ඔවුන්ව රඳවාගෙන තබා ඇත. මේ අතරතුර ඇලිමෝනියාවේ සියලුම රජයේ පාසල් වල අධ්‍යාපනය ලබන දරුවන් , ඔවුන්ගේ ආගම නොසලකා, විශේෂිත බෝලාවරුන්ගේ නිල ඇඳුමක් ඇඳීමට හා බෝලා ආගමට අදාල උදෑසනය යාඥාවල නිරතවීමට අවශ්‍ය බව දන්වා තිබේ. ටෝලා සහ ක්‍රියා යන්න ද ආගමික සුළු ජන කණ්ඩායම් ලෙස සලකන අතර, යම්

තැනැත්තෙකු තම ආගමික පරිචයන් අත්හැර දැමූහොත් එකී වෙන්වීම හෝ දුරස්ථ දුරස්ථභාවය මරණීය දණ්ඩනය ලබාදිය හැකි ආගමික අපරාධයක් වන බවට, මෑතකදී ඔවුන්ගේ ආගමික නායකයින් ආගමික ආඥාවක් සම්මත කරගන්නා ලදී.
"ආගමික නිදහස සුරකින්නන්" නම් මානව හිමිකම් සංවිධානයක් ඇලිමෝනියා හි ආගමික නිදහස සුරැකීම පිළිබඳ තත්ත්ව විග්‍රහ වාර්තාවක් (situation paper) ලිවීමට ඔබට භාර දී තිබේ. රාජ්‍යයන් හී දේශීය, අන්තර්ජාතික ප්‍රමිතීන් හා මානව හිමිකම් වගකීම් ඇසුරෙන් ඔබගේ තත්ත්ව විග්‍රහ වාර්තාව ලියන්න.

(ලකුණු 100)

4. සබර්නියා ජනරජය නව ඉඩම් ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත් කළ අතර ඒ යටතේ ජනවාර්ගික පංගු ක්‍රමයක්, පදනම් කරගෙන අඩු පහසුකම් සහිත පවුල් අතර රාජ්‍ය ඉඩම් බෙදාදෙනු ලැබේ. මේ ඉඩම් ප්‍රතිපත්තිය යටතේ පවුල් යන නිර්වචනය තුළින් සමරිසි විවාහයන් ඉවත් කර ඇත. ස්වදේශික ගෝත්‍රයක් වන සුමේරියන් ප්‍රජාවේ නායකයින් නිවේදනය කර සිටියේ තම කණ්ඩායම සමස්ත ජනගහනයෙන් 10% පමණක් නියෝජනය කරන අතර, ඔවුන්ගේ පුරාතන චාරිත්‍ර අනුව ඔවුන් සමරිසි විවාහ පිළිගන්නා බැවින්, මෙම ඉඩම් ප්‍රතිපත්තිය හරහා තමන් අවාසියට ලක්වන බවයි. "*ඔහුගේ හෝ ඇයගේ නමට ස්ථිර පදිංචි ස්ථානයක් හිමි හෝ තම දෙමාපියන්ගේ නමට ස්ථිර පදිංචි ස්ථානයක් හිමි සෑම පුරවැසියෙකු විසින්ම මැතිවරණයකදී ඡන්දය භාවිතා කළ යුත්තේය*" ලෙස අලුත් වගන්තියක් මැතිවරණ පනතට හඳුන්වාදීමේ ස්වකීය චේතනාව ත් සබර්නියා ආණ්ඩුව නිවේදනය කර තිබේ. සුමේරියන්වරු තර්ක කර සිටින්නේ ඉහත යෝජිත නීතිය හරහා ඔවුන් අවාසියට ලක්වන බවත්, ඒ මන්දයත් සුමේරියන්වරුන්ගෙන් හරි අඩක් තැනැත්තන්, දඩයම්කරුවන් වන අතර ඔවුන්ට අයිති පෞද්ගලික ඉඩම් නොමැති බවත්ය.

සුමේරියන්වරු ඉඩම් අමාත්‍යවරයාට පෙත්සමක් ඉදිරිපත් කරමින් මෙම ඉඩම් ප්‍රතිපත්තිය අභියෝගයට ලක්කළ ද, පෙත්සම, එරට රාජ්‍ය භාෂාවක් නොවන , සුමේරියන්වරුන්ගේ මව් භාෂාවෙන් ලියා තිබීම හේතුවෙන්, රජයේ අධිකාරීන් විසින් එය ප්‍රතික්ෂේප කරන ලදී.

සබර්නියා ව සියලුම ප්‍රධාන මානව හිමිකම් ලේඛනයන්ට පාර්ශවකරුවන් බව උපකල්පනය කරමින් මෙකී නීති සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ විශ්ලේෂණය කරමින් සංක්ෂිප්ත මානව හිමිකම් වාර්තාවක් ලියන්න.

(ලකුණු 100)

5. ඔබ මානව හිමිකම් කවුන්සිලය මගින් ශ්‍රී ලංකාවේ භාෂණයේ නිදහස පිළිබඳ පත් කළ විශේෂඥ කමිටුවේ සාමාජිකයෙකු බව උපකල්පනය කරන්න. ශ්‍රී ලංකාවේ භාෂණයේ නිදහස සහ ඒ හා සබැඳි අයිතීන් ආරක්ෂා කිරීමේ තත්ත්වය විශ්ලේෂණය කරමින් පසුගිය මාස 12 ආවරණය වන පරිදි, වාර්තාවක් ලිවීම ඔබගෙන් අපේක්ෂා කරයි. ඔබගේ වාර්තාව තුළ, රට තුළ මානව හිමිකම් ආරක්ෂා කිරීම පිළිබඳ විශාල බලපෑමක් ඇති කළ බවට, ඔබ සලකන උදාහරණ අවම වශයෙන් හතරක්වත්(04) ඇතුළත් විය යුතුය.

(ලකුණු 100)

6. **<u>(අ) සහ (ආ) කොටස් දෙකටම</u>** පිළිතුරු සපයන්න.

(අ) ළමා අයිතිවාසිකම් සම්මුතිය (CRC) යටතේ පිළිගෙන තිබෙන එක් (01) හරයාත්මක අයිතිවාසිකමක් තෝරාගෙන ශ්‍රී ලංකාව තුළ එකී තෝරා ගත් අයිතිවාසිකමෙහි වත්මන් තත්ත්වය විවේචනාත්මකව විග්‍රහ කරමින් අන්තර්ජාතික නීති සඟරාවකට ලිපියක් ලියන්න.

එම ලිපිය තුල ළමා අයිතිවාසිකම් සම්මුතියෙහි ඇතුළත් ප්‍රධාන මූලධර්ම ඇසුරින් අවම වශයෙන් උදාහරණ දෙකක් (02) වත් සාකච්ඡා කිරීම ඔබගෙන් අපේක්ෂා කෙරේ.

(ලකුණු 50)

(ආ) කාන්තාවන්ට එරෙහි සියලූම ආකාරයේ වෙනස්කම් තුරන් කිරීමෙහි සම්මුතියෙන් (CEDAW) පිළිගෙන තිබෙන එක් (01) අයිතිවාසිකමක් තෝරාගෙන, දකුණු ආසියානු සන්දර්භය තුළ එකී අයිතිවාසිකමෙහි වර්තමාන තත්ත්වය පිළිබඳව විවේචනාත්මකව විග්‍රහ කරමින් අන්තර්ජාතික නීති සඟරාවකට ලිපියක් ලියන්න.

එම ලිපිය තුල කාන්තාවන්ට එරෙහි සියලූම ආකාරයේ වෙනස්කම් තුරන් කිරීමෙහි සම්මුතියෙහි ඇතුළත් ප්‍රධාන මූලධර්ම ඇසුරින් අවම වශයෙන් උදාහරණ දෙකක් (02) වත් සාකච්ඡා කිරීම ඔබගෙන් අපේක්ෂා කෙරේ.

(ලකුණු 50)

**************